**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2020**

---

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877 (2)(ඇ) වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල නමින් ගම්පොල ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලබන රු.4,000,000 ක් වටිනා ස්ථාවර තැන්පත් 03 කට අදාළ ස්ථාවර තැන්පතු සහතික විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | බැංකුව විසින් සහතික කළ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ බව භාණ්ඩාගාරික විසින් ප්‍රකාශ කර ඇතත් සහතික ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු සහතික ඉදිරිපත් කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආදායම් ලේඛනය අනුව 2020 වර්ෂයේදී ප්‍රවේශපත් විකිණීමෙන් ලද ආදායම රු.9,525,575 ක් ලෙස දක්වා තිබුණද, නිකුත් කළ ඇතුළත්වීමේ අවසරපත් හි පිළිපත් පිටපත් ගිනි තබා විනාශ කර තැබීම නිසා එම ආදායම සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | දෛනික ප්‍රවේශපත් අලෙවිය පිළිබඳ සටහන් කර ඇති ලේඛනයේ ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳ විස්තර සටහන් කර ඇති බව. | ආදායම සන්නිරීක්ෂණය කිරීමට ඇතුළත් වීමේ අවසර පත්හි පිළිපත් ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල සේවය කරන අධිකාරියෙන් වැටුප් හා දීමනා ලබන කාර්ය මණ්ඩලයට, ඊට සහභාගී වූ රජයේ නිලධාරින් හා වෙනත් අය වෙත 2020 වර්ෂයේ අවස්ථා 07 කදී රු.558,463 ක් වැය කර ආහාර පාන සපයා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | මුදල් රෙගුලාසි 156(7) ප්‍රකාරව සියළු මූල්‍ය ගනුදෙනුවල නිසි පිරිමැසුම්භාවයකින් ක්‍රියාත්මක කළයුතු අතර වාර්ෂික අයවැය ලේඛනයෙන් අනුමැතිය ලබගෙන නොතිබියදී හා එම වියදම් සනාථ කෙරෙන ලැයිස්තු ඉදිරිපත් කර නොතිබියදී වැටුප් හා වෙනත් දීමනා ලබන නිලධාරීන් වෙත මෙසේ ආහාර පාන සැපයීමෙන් අරමුදලට පාඩුවක් සිදු කර ඇති බව. |
| (ඇ) | විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව අරමුදල සතු වාහන 02 ක් රජයේ තක්සේරුකරුවකුගේ පෞද්ගලික තක්සේරුව මත රු.මිලියන 7.5 කට ඉකුත් වර්ෂයන්හිදී බාහිර පුද්ගලයින් වෙත විකුණා ඇති බව භාර අරමුදලේ භාණ්ඩාගාරික විසින් ප්‍රකාශ කෙරුණද, ඊට අදාළ තක්සේරු ලේඛන, වාහන විකිණීමෙන් ලද මුදල පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පසුව විස්තර වාර්තා ඉදිරිපත් කරන බවත් ස්ථාවර වත්කම් ලේඛණය (2020) විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියා කළ යුතු අතර ගනුදෙනුවලට අදාළ සියළු තොරතුරු ඉදිරිපත් කළ යුතු බව. |

## 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවා | සමාලෝචිත වර්ෂය තුළ රු.149,816 ක සේවක දායකත්වය සහ රු.224,724 ක සේවා දායකත්වය ද වශයෙන් | පිළිතුරු සපයා නොමැත. | අදාළ පනත් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | එකතුව රු.374,540 ක් ද රු.56,181 ක සේවක භාර අරමුදල් දායකත්වය ද අදාළ අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------- | | | |
| i. | මුදල් රෙගුලාසි 137 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් අනුමත නොකළ වවුචර් 52 ක් සඳහා රු. 5,493,696 ක් ගෙවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රෙගුලාසිය ප්‍රකාරව ගෙවීම් අනුමත කළ යුතු බව |
| ii. | මුදල්රෙගුලාසි 138 හා 257 | - සහතික කළ වවුචර් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී සහතික නොකළ වවුචර් 139 ක් සඳහා රු.15,946,943 ක් ගෙවීම් කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව. |
| | | - වවුචරයෙහි මුහුණත, ප්‍රස්තුත ගෙවීම් ලැබීමට හිමිකම් ඇත්තවුන් කවුරුන්ද යන්න සඳහන් නොකොට හා වවුචරයේ සෑම විස්තරයක් සම්පූර්ණ කර නොතිබියදී වවුචර් 16 ක් මඟින් එකතුව රු.2,427,180 ක් ගෙවීම් කර තිබුණි.<br>- | පිළිතුරු සපයා නොමැත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව.<br>. |
| iii. | මුදල් රෙගුලාසි 237(ආ) | එකතුව රු.1,448,546 ක් වූ ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද, ඒ සඳහා තොග සහතික වවුචරයට අමුණා නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව. |
| iv. | මුදල් රෙගුලාසි 264 | සමාලෝචිත වර්ෂයේ වවුචර් 70 ක් මගින් ගෙවීම් කර තිබුණු එකතුව රු.8,589,583 ක් සඳහා ආදායකයාට මුදල් ලැබුණු බවට කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව.<br>. |

| | | | | |
|---|---|---|---|---|
| v. | මුදල් රෙගුලාසි 272(3) | සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු. 553,751 ක් වටිනා ගෙවීම් 03 කට අදාල වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු සපයා නොමැත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | i) විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව පෞද්ගලික ආයතනයක තක්සේරුව මත අරමුදල සතු රු. මිලියන 8.9 ක් වැය කර මෝටර් රථයක් ආයෝජන සමාගමකින් ඉකුත් වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. | පසුව විස්තර වාර්තා ඉදිරිපත් කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ යුතු බව. |
| | | ii) වැඩ හා සේවා සලසා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.675,750 ක් ගෙවීම් කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියා කළ යුතු බව. |
| | | (iii) ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව එකතුව රු.351,500 ක් වැය කර ප්‍රවේශ පත්‍ර යන්ත්‍රය, එහි මෘදුකාංගය, කාර්යාල තිරරෙදි සහ පුටු මිලදීගෙන තිබූ අතර එම වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව. |

**2.3. නොසැසදීම්**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ----------- |
| **(අ)** | භාරකාර මණ්ඩලය විසින් විගණනය වෙත ඉදිරිපත් කළ මුදල් එකතු කිරීම් ලේඛනය අනුව, ඇතුළත්වීමේ අවසර පත් විකිණීමෙන් ලද මුදල හා බැංකුවේ තැන්පත් කළ මුදල අතර රු.834,673 ක ඌනතාවයක් පැවතුණි. | පිළිතුරු සපයා නොමැත. | මුදල් ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(ආ)** | භාරකාර මණ්ඩලයේ නිලධාරීන් විගණනය වෙත ඉදිරිපත් කළ වවුචර් අනුව ගෙවූ මුදල එකතුව රු.15,946,943 ක් වූ | පිළිතුරු සපයා නොමැත. | වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීම කළ |

| | | |
|---|---|---|
| අතර 2020 වර්ෂයේ බැංකු ප්‍රකාශන අනුව ගෙවන ලද චෙක්පත්වල එකතුව රු.15,445,864 ක් වූයෙන් රු.501,079 ක වෙනසක් පැවතුණි. | | යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අරමුණු කරා ළඟා නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්බුළුවාව ජෛව විවිධත්ව භාරය මගින් සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද ගනුදෙනු හා මෙහෙයුම් පරීක්ෂාවේදී 2009 අංක 44 දරන පනතේ 4 වන වගන්තියේ වූ අරමුණු 20 ක් අතරින් පුද්ගලයින්ගේ ක්‍රීඩා සහ විනෝද කටයුතු පිළිබඳ හැකියාවක් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම ගොවියන් ධෛර්යමත් කිරීම සහ ප්‍රජාව තුළ තරුණ ගොවි සංවිධාන පිහිටුවීම, අම්බුළුවාව කඳුපෙළ වටා ප්‍රදේශය වැඩි දියුණු කිරීම හා බුද්ධිමත්ව, බැංකුවල සහ වෙනත් මූල්‍ය ආයතනවල ආයෝජනයන් කිරීමට තැනැත්තන් උනන්දු කරවීම යන අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | අරමුදලට ලැබෙන ආදායම් උපයෝගි කර ගනිමින් සංකීර්ණය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් යොදා ගනිමින් ඔවුනට සාධාරණ වැටුපක් ගෙවීම මත ඔවුන්ගේ පැවැත්ම සඳහා උපකාරී වීම, ජීවන තත්ත්වය උසස් කර ගැනීමට සහය වීම, ඉදිරි කාර්යයන් සඳහා විවිධ අංශයන් පිළිබඳ පුහුණු ශ්‍රමිකයන් පිරිසක් ඇති කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීම, සාමාජීය හා ආර්ථික ක්‍රියාකාරකම් තුළ යහපත් සහයෝගීතාවයන් ඇති කිරීම යනාදී කරුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති බව. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

**3.2 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරු ලෙස සේවය කළ අයගේ හා රියදුරු ලෙස සේවය කළ අයගේ දෛනික පැමිණීම පිළිබඳව කිසිදු වාර්තාවක් පවත්වා නොමැතිව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.725,000 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. මෙම තනතුරුවලට අදාළව පත්වීම් ලිපියක් ලබාදී නොතිබීම නිසා එහි නිරවද්‍යතාවය තහවුරු නොවුණි. | පිළිතුරු සපයා නොමැත. | මුදල් රෙගුලාසි 156 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 පරිදි කටයුතු කළ යුතු බව. |
| (ආ) | අරමුදල සතු කැපටේරියා හෝටලය (සැනෝරා) සමාලෝචිත වර්ෂයේ මැයි මස සිට දෙසැම්බර් දක්වා බාහිර පුද්ගලයෙක් වෙත ලබාදී ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබුණද ඊට අදාළව බදු ගිවිසුමක් ඇතිකර ගැනීමට හා ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හෝටලය මෙතෙක් සුභසාධක සේවාවක් වශයෙන් පවත්වාගෙන යෑම නිසා අය කිරීමක් නැත. එහෙත් 2021 වර්ෂයේ අගෝස්තු මස සිට මාසික කුලියක් අය කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී වාහන අළුත්වැඩියා වෙනුවෙන් එකතුව රු.271,950 ක වියදමක් දරා තිබුණද, උක්ත අළුත්වැඩියාවන්ට පෙර හා පසු යාන්ත්‍රික ඉංජිනේරුගේ හෝ මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | යාන්ත්‍රික ඉංජිනේරුගේ හෝ මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය ලබාගත යුතු බව. |

## 3.4 මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෛනික මුදල් ලැබීම් අප්‍රමාදව බැංකු ගත කළ යුතු වුවද, ලද ආදායම් රු. 406,160 ක් බැංකුගත කිරීමකින් තොරව වියදම් කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | එකතු කරනු ලබන මුදල් අප්‍රමාදව බැංකු ගත කිරීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 387 ප්‍රකාරව චෙක්පත් මඟින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා සොයා බැලිය යුතුය. එසේ වුවද, අරමුදලේ දීර්ඝ කාලයක සිට බැංකු අයිරාවක් පවතින බව නිරීක්ෂණය වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හා අවසන් දිනට පිළිවෙළින් රු.904,108 ක් හා රු.2,138,192 ක් විය. | මෙම වර්ෂය තුළ සංවර්ධන ව්‍යාපෘති රැසක් සිදුකළ නිසාත්,ආදායම් තත්ත්වය දුර්වල වූ නිසාත් බැංකු අයිරාවක් ලබා ගැනීමට සිදු වූ බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල සතුව රු.80,000 ක් වටිනාකමැති පෝනියන් 04 ක් සිටී බවට ලේඛන තුළින් අනාවරණය වූ අතර, ඒ පිළිබඳ පරීක්ෂාවේදී ඉන් දෙදෙනෙකු මියගිය බව භාණ්ඩාගාරික විසින් සඳහන් කරන ලදි. මියගිය සතුන් පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකර නොතිබීම නිසා එම සතුන් මියගිය බවට සනාථ නොවුණි. | අදාළ කාරණය සම්බන්ධයෙන් පියවර ගැනිම අතපසු වී ඇති බව. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළයුතු බව. |
| (ආ) | භාර අරමුදල සතුව පවතින සංචාරක නිවාස වෙනුවෙන් 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙළින් රු.153,698 ක්, රු.148,903 ක් සහ රු.6,550 ක් ලෙස එකතුව රු.309,151ක් වියදම් දරා තිබුණ ද සංචාරක නිවාස මඟින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතු බව. |

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 684/2001 නඩු කටයුත්ත සඳහා අවස්ථා 06 කදී බිල්පත් හෝ ලදුපත් නොමැතිව නීතීඥ ගාස්තු ලෙස රු.515,000 ක් නීතීඥයින් දෙදෙනෙකු වෙත ගෙවා තිබුණි. | මෙම ඉඩම් නඩුවෙන් ඉවත්ව ඇති අතර නීතීඥයන් විසින් ලදුපත් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති බව. | අදාල තහවුරු කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කර නොතිබුණු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගෙවීම් ලාභියා හා ඉදිරිපත් කළ බිල්පත් නොගැළපීම, විවෘත බිල්පත්(on Approval Bil) ඉදිරිපත් කර තිබීම, බිල්පත් නොමැතිවීම,භාරයේ කාර්ය මණ්ඩලයේ අය නමට වවුචර් හා චෙක්පත් ලියා තිබීම යනාදී කාරණා හේතුවෙන් රු.1,497,053 ක් වූ ගෙවීම් අවස්ථා 11 ක් විගණනයේදී පිළිගත නොහැකි විය. | පිළිතුරු සපයා නොමැත. | - එම - |
| (ඇ) | ශෛලමය බුදු පිළිමය සැකසීම සඳහා කඩා ඉවත් කරනු ලබන ගල් මිනුම් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර එම ගල් අලෙවිය හෝ වෙනත් ඵලදායී කටයුත්තකට යොදවා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.වෙළඳපල මිල රු.9,833,130 ක් පමණ වන මෙම කඩා ඉවත් කරන ලද කළුගල් කියුබ් 2185.14 වැඩ බිම තුළ නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගයන්ද හෙළිදරව් නොකෙරුණි. | ගල් කැඩීමෙදී පුපුරා විසිවන ගල් ආසන්නයේ ඇති බැවුම වෙත ඇද වැටේ. මාර්ගයේ ඉතිරි ගල් පමණක් මැනුම් කර බැවුමට තල්ලු කිරීම සිදු කරන ලද බව | - එම - |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------ |
| **(අ)** | සංකීර්ණයේ නිර්මාතෘවරයාගේ පිළිරුව නෙළීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් හෝ ශිවිසුම්ගත වීමක් නොමැතිව පුද්ගලික ආයතනයක් වෙත 2020 වර්ෂයේ ජනවාරි මස රු.500,000 ක් අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද, එම කාර්යය නිසි පරිදි ඉටු කර නොතිබුණි. | ශෛලමය අනුරුව නෙළීම සඳහා ලක්ප්‍රිය ට්‍රේඩර්ස් වෙත භාරදී තිබූ අතර ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු.500,000 ක මුදලක් ගෙවන ලදී. නමුත් අවශ්‍ය ආකාරයට නිවැරදිව එම කාර්යය ඉටු නොවීම නිසා එය නතර කරන ලදී.ඉන් පසුව ගෙවන ලද අත්තිකාරම් මුදල නන්දන කන්ස්ට්‍රක්ෂන් වෙත භාරදී ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු බව. |
| **(ආ)** | ශෛලමය බුදු පිළිමය නෙළීම සඳහා ගල් කඩා ඉවත් කිරීම පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ වෙනත් පෞද්ගලික ආයතනයකට ගෙවූ රු.500,000 ක අත්තිකාරම් ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී රු.මිලියන 2.3 ක් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේ දී කළුගල් කැඩීමට හා එය බැකෝ යන්ත්‍රයෙන් ඉවත් | රට පුරා පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් අදාළ කර්මාන්තය තාවකාලිකව නතර කරන ලදී. | කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා විධිමත් ක්‍රම වේදයක් අනුගමනය කළයුතුය. ශක්‍යතා අධ්‍යයනයකින් ඵළදායී ලෙසට හඳුනාගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු බව. |

කිරීමට අවස්ථා 11 කදී රු.3,421,250 ක් ගෙවා තිබුණ ද මේ වනවිට මෙම කාර්යය අතර මඟ නවතා දමා තිබුණි

**3.8 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණිත දිනය වන විට රුපියල් 33,400,000 ක පොත් වටිනාකම වූ පුස්තකාලය, කැපටේරියා 02,සම්මන්ත්‍රණ ශාලාව,සංචාරක බංගලාව අංක 01 හා 02 ලෙස ගොඩනැගිලි 05 ක්, වටිනාකම විගණනයට ඉදිරිපත් නොකළ රංග ශාලාව හා කළමනාකරණ නිවාසය සමාලෝචිත වර්ෂයේ දී ද කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනයට කටයුතු කළ යුතු බව. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් බැහැරව රු.230,000 ක මුදලක් වැයකර සංචාරකයන්ට භාවිතා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබූ ඉලෙක්ට්‍රොනික් යතුරුපැදිය ධාවන තත්ත්වයට නුසුදුසු බැවින් අපේක්ෂිත අරමුණ සඳහා යොදාගෙන නොතිබුණි. එම මිලදී ගැනීමට අදාළව නිර්දේශය, අනුමැතිය සහ වියදම සහතික කිරීම කර නොතිබූ අතර ඊට අදාළ බිල්පත් හා ලදුපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර අදාළ යතුරුපැදිය භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු සපයා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියා කළ යුතු වීම හා අරමුණුගත කාර්යය සඳහා යොදවාගත යුතු බව. |

**3.9 අරමුදලේ අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාරකාර මණ්ඩලය විසින් අම්බුළුවාව පරිශ්‍රයේ ජෛව විවිධත්වය සංවර්ධනය හා පරිසර සංරක්ෂණය මූලික කරගෙන සංවර්ධන කටයුතු සිදු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,132,500 ක වියදමක් දරමින් පස් කැපීම කර තිබීම නිසා අම්බුළුවාව පරිශ්‍රයේ ජෛව විවිධත්වයට හා පාරිසරික තත්ත්වයන්ට බරපතල හානියක් වන බවට නිරීක්ෂණය විය. මෙම කටයුතු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශයේ හා | පිළිතුරු සපයා නොමැත. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ හා අනුමැතීන් ලබා නොගෙන ජෛව විවිධත්වයට හානි වන ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ හා අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව භාර අරමුදල සඳහා වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර එය භාරකාරිත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කරවාගෙන ඊට අනුකූල ලෙස අයවැය පාලනය කරමින් අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කළ යුතු වුවත් එලෙස සිදුකර නොතිබුණි. | මෙම අඩුපාඩුව මඟහරවා ගැනීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර වියදම් දැරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගත යුතු බව. |